# කොළඹ සුළු හිමිකම් දිසා අධිකරණයේදීය

සී/ස ෆින්ටෙක් සොෆ්ට්වෙයා සොලුෂන්ස් පුද්ගලික සමාගම,
අංක 321,බී1, ලක්ෂ්මන් ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ-03.
(කලින් අංක 46/07, වේලියන්ට් ටවර්, නවම් මාවත, කොළඹ 02.)

පැමිණිලිකරු

නඩු අංකය -DMR/ SC/ 2905 /2023
ස්වභාවය - මුදල්
කාර්යපටිපාටිය- සාමාන්‍ය
වටිනාකම - රු.52,600 -

එදි

[redacted]

විත්තිකරු

වර්ෂ 2023 ක් වූ දෙසැම්බර් මස 15 වන දින දීය

ඉහත නම් සඳහන් පැමිණිලිකරු ස්වකීය නීතිඥ ඩිල්ෂාන් වීරසේකර මහතා මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලෙන් මෙසේ ප්‍රකාශකර සිටී.

01. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ, පහත වැඩිමනත් ලෙස විස්තර කරන නඩු නිමිති උපවය වූයේද පැමිණිල්ලට පැ-5 ලෙස අමුණා ඇති ගිවිසුමට එළඹියේද මෙම ගරු අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ බැවින් සහ රු.2,000,000/ක වඩා අඩු වටිනාකමකින් යුත් මුදලක් විත්තිකරුගෙන් පැමිණිලිකරු වෙත අයකරවා ගැනීම සඳහා මෙම නඩුව පවරන බැවින් මෙම නඩුව අසා නිම කිරීමට 2022 අංක 33 දරණ සුළු හිමිකම් කාර්ය පටිපාටිය පනත ප්‍රකාරව මෙම ගරු අධිකරණයට ප්‍රාදේශීය අධිකරණ බලය ඇති බවයි.

02. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ තමුන් සිය සමාගම සතු අරමුදල් භාවිත කරමින් සුළු පරිමාණ ණය දීම සිදුකරන ආයතනයක් වන බවත් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ PV00224207 අංකය මතින් නිසි පරිදි සංස්ථාගත සීමා සහිත වගකීමක් ඇති පුද්ගලික සමාගමක් වන බවත් තම සංස්ථාපිත නාමය යටතේ නඩු පැවරීමට හා පවරනු ලැබීමට හැකි නෛතික ශක්‍යතාවයක් ඇති බවත්ය.

*පැමිණිලිකාර සමාගමේ සංස්ථාපිත සහතිකයේ සත්‍ය පිටපතක් මේ සමග පැ-1 ලෙස ලකුණු කොට පැමිණිල්ලේම කොටසක් ලෙස ඉදිරිපත් කර සිටිමි.*

03. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ තමුන් වර්ෂ 2020 සිට සුළු පරිමාණ ණය දීමේ ව්‍යාපාරයක නිරතව සිටින බවත් විශේෂයෙන්ම එකී ණය දීම නවීන තාක්ෂණය භාවිතා කරමින් https://loanme.lk/ වෙබ් අඩවිය ඔස්සේ හෝ https://play.google.com/store/apps/details?id=fintech.mobile.loanme යන ඇප් මෘදුකාංගය හරහා සිදු කරනු ලබන බවත්ය.

04. පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශකර සිටින්නේ තම ණය පහසුම සලසා දීමේදී ණයකරුගෙන් කිසිදු අමතර ලේඛනයක් හෝ සුරැකුමක් ලබා නොගන්නා බවත් ණයකරු විසින් සපයන දත්ථයන් මත ඔහුගේ හෝ ඇයගේ දුරකතන අංකය සමග සම්බන්ධ වෙමින් පරිගනක පද්ධතියෙන් සිදුකරනු ලබන ණය අයදුම් ක්‍රියාවලියක් හරහා අදාල ණය මුදල ණයකරු හෝ ණයකාරිය විසින් ඇතුලත් කරනු ලබන බැංකු ගිණුමට බැර කිරීමට පැමිණිලිකරු කටයුතු කරන බවය.

05. ඒ අනුව පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුගේ වෙබ් අඩවියට/ඇප් පහසුකමට පිවිසෙමින් පැමිණිලිකාර ආයතනයෙන් රුපියල් 40,000 - ක ණය මුදලක් වර්ෂ **2022-11-06** දින අයදුම්කර ඇති බවයි.

06. තවදුරටත් පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ විත්තිකරු විසින් සිය දුරකතන අංකය ලෙස [redacted] යන ජංගම දුරකතන අංකය භාවිතා කරමින් තම ණය පහසුම ලබාගැනීම සඳහා පැමිණිලිකරු සමග සම්බන්ධ වී ඇති බවත් එකී ණය අයදුම් කිරීම අරමුණු කොට ගෙන පැමිණිලිකරුගේ ඉහත කී වෙබ් අඩවියට සහ/හෝ මෘදුකාංගයට පිවිසීම හේතු කොටගෙන විත්තිකරුට පමණක් අදාල වන්නාවූ එක්වරක් භාවිතා කිරීමේ මුරපදය ලෙස **796** දරන මුරපදය පද්ධතිය විසින් ස්වයංව නිර්මාණය කොට ඇති බවත් විත්තිකරු සහ පැමිණිලිකරු අතර වූ සියලු සම්බන්ධතා එකී මුරපදය මත පදනම්ව සිදු වී ඇති බවත්ය.

*එකී අයදුම් පත්‍රයට අදාලව විත්තිකරු විසින් මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කොට ඇති දත්තයන් දැක්වෙන පද්ධතියේ පරිගනක පිටපතක් මේ සමග* ***පැ-2*** *ලෙසද අදාල අයදුම්පත සමග විත්තිකරු විසින් අමුණා ඇති සිය ජාතික හැඳුනුම්පතෙහි/රියදුරු බලපත්‍රයෙහි සත්‍ය පිටපතක්* ***පැ-3*** *ලෙසද ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය සමග ණයකරු ලෙස විත්තිකරු විසින් ලබා ගන්නා ලද සහ/හෝ විත්තිකරු විසින්ම තම වෙබ් අඩවියට සහ/හෝ ඇප් මෘදුකාංගයට උඩුගත කරන ලද ඡායාරූපයේ පිටපතක්* ***පැ-4*** *ලෙසද ලකුණු කොට මෙහිම කොටසක් මෙන් අයැද ඉදිරිපත් කර සිටී.*

07. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ ඉහත පැ-2, පැ-3 සහ පැ-4 ලේඛන විත්තිකරු විසින් සම්පූර්ණ කළ පසු විත්තිකරු විසින් සපයනු ලැබ ඇති [redacted] යන විද්‍යුත් තැපැල් ලිපිනයට වර්ෂ **11/6/2022** වෙනි දින **12:34:20 PM** වේලාවට ණය සැපයීමට අදාල ණය ගිවිසුම පැමිණිලිකරුට අයත් [redacted] යන විද්‍යුත් තැපැල් ලිපිනයෙන් යවා ඇති බවයි.

*ඉහත කී ණය ගිවිසුමෙහි පිටපතක් මේ සමග* ***පැ-5*** *ලෙස ලකුණු කොට ඉදිරිපත් කර සිටිමි.*

08. එකී පැ-5 දරන ණය ගිවිසුම අනුව විත්තිකරු සහ පැමිණිලිකරු විසින් වෙනත් දේ අතර පහත කොන්දේසි වලින් බැඳී ඇති බව පැමිණිලිකරු ප්‍රකාශකර සිටී.

i. විත්තිකරු විසින් පැමිණිලිකරුගේ දත්ත පද්ධතියට සපයා ඇති බැංකු ගිණුම වෙත අදාල ණය මුදල පැමිණිලිකරු විසින් බැර කිරීමටත්,

ii. ණය ගිවිසුමෙහි දක්වා ඇති ගෙවීමේ දිනට නියමිත පරිදි ණය මුදල ගෙවනු ලබන්නේ නම් විත්තිකරු විසින් ණය මුදල හා අදාල සේවා ගාස්තුව පමණක් පැමිණිලිකරු වෙත අයකර ගැනීමටත්,

iii. ණය ගිවිසුමෙහි දක්වා ඇති නියමිත දිනට අදාල ණය මුදල විත්තිකරු විසින් ගෙවීමට අපොහොසත් වන්නේ නම් අදාල නියමිත දින පසුව එළඹෙන දෙවන දින සිට ණය මුදලට අමතරව අමතර සේවා ගාස්තුවක් සහ ප්‍රමාද ගාස්තුවක් ණය මුදලට අමතරව ලෙස ගෙවා නිම කිරීමටත්,

iv. නියමිත දිනට ණය මුදල ගෙවා අවසන් කිරීමට අසමත් වන්නේ නම් විත්තිකරු විසින් පසුව ගෙවන මුදල් පැ-5 ගිවිසුමෙහි කොන්දේසිය යටතේ වන පිළිවෙල පරිදි ගෙවා නිම කිරීමටත් ය.

09. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ විත්තිකරු විසින් සිය ණය පහසුකම භාවිතා කරමින් රුපියල් **40,000 -** මුදලක් වර්ෂ **2022-11-06** දින ඔහුගේ බැංකු ගිණුම වෙත පැමිණිලිකරුගෙන් ලබාගෙන සහ/හෝ බැරකරවා ගෙන ඇති බවත්,

10. තවදුරටත් පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ එකී ණය මුදල ගෙවීමට නියමිත 2022-12-06 දින වන විට අදාල ණය මුදල ගෙවා නිම කිරීමට විත්තිකරු විසින් අසමත් වී ඇති බවය.

11. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ විත්තිකරු විසින් සිය ණය මුදල ගෙවීමට නියමිත දින වූ වර්ෂ **2022-12-06** දිනට අදාල ණය මුදල ගෙවා නිම කිරීමට අසමත් වීම හේතුවෙන් වර්ෂ **2022-12-06** දින වන විට විත්තිකරු රුපියල් **52,600** - මුදලක් පැමිණිකරුට ගෙවා නිම කළයුතු බවයි.

*විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු මුදල සවිස්තරව දැක්වෙන ගිණුම් වාර්තාව මේ සමග **පැ-6** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් මෙන් අයැද ඉදිරිපත් කර සිටිමි.*

12. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ පැමිණිල්ලෙන් හබගත කරුණ සම්බන්ධයෙන් තම නියෝජිතයන් විසින් සමථ මණ්ඩය වෙත අයදුමක් ඉදිරිපත් කරනු ලැබුවද එහිදී පවා ප්‍රශ්නගත හබය විසඳා ගැනීමට නොහැකි වූ බවයි.

*ඉහත කී පරිදි සමත මණ්ඩය විසින් පැමිණිලිකරු වෙත නිකුත් කරනු ලැබූ සමත නොකිරීමේ සහතිකයේ මුල් පිටපතක් මේ සමග **පැ-7** ලෙස ලකුණු කොට මෙහිම කොටසක් මෙන් අයැද ඉදිරිපත් කර සිටිමි.*

13. කරුණු එසේ හෙයින් පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ පැමිණිලිකරුගේ වාසියට විත්තිකරුට එරෙහිව පහත පරිදි නඩු නිමිති උපවය වී ඇති බවයි.

i. ඉහත පැ-5 ලෙස දක්වා ඇති ලේඛනය ප්‍රකාරව විත්තිකරු විසින් වර්ෂ **2022-11-06** දිනැතිව පැමිණිලිකරුගෙන් ණයක් ලෙස ලබා ගත් රුපියල් **40,000** - ක් වූ ණය මුදල විත්තිකරුගෙන් අයකර ගැනීමටත්

ii. එකී රුපියල් **40,000** - ණය මුදල ගෙවීමට නියමිත වූ **2022-12-06** දිනට නොගෙවීම හේතුවෙන් සේවා ගාස්තු (Service fee) ලෙස රුපියල් **10,856** - මුදලක් විත්තිකරුගෙන් අයකර ගැනීමටත් ය.

14. පැමිණිලිකරු ප්‍රකාශකර සිටින්නේ අදාල මුදල් ලබා දෙන ලෙස විත්තිකරු අමතා කීප අවස්ථාවකදීම ඉල්ලීම් කළත් එකී ඉල්ලීම් සියල්ලම විත්තිකරු විසින් පැහැරහැර ඇති බවත් ඒ හේතුවෙන් පැමිණිලිකරු විසින් සිය නීතිඥයන් මාර්ගයෙන් විත්තිකරුට එන්තරවාසියකින් අදාල මුදල් ගෙවන ලෙසට වර්ෂ **2023-12-06** දින දැනුම් දුන් බවත්ය.

*ඉහත කී එන්තරවාසි ලිපියෙහි පැමිණිලිකරු සතු පිටපතේ සත්‍ය පිටපතක් මේ සමග **පැ-8** ලෙසද එකී තැපැල් භාන්ඩ කුවිත්තසියේ සත්‍ය පිටපතක් **පැ8-අ** ලෙසද ලකුණු කොට මේ සමග මෙහිම කොටසක් මෙන් අයැද ඉදිරිපත් කර සිටිමි.*

15. පැමිණිලිකරු මෙම නඩුව රුපියල් **52,600** - කට මුද්දර ගාස්තු ගෙවීමේ කාර්ය සඳහා තක්සේරු කර සිටී.

16. තම පැමිණිල්ලේ කරුණු සනාථ කරනු පිණිස පැමිණිකාර සමාගමේ කළමණාකාරිය වන ලූඩ්ස් පවිත්‍රා තිවියා කාර්තිගේසු අයගේ දිවිරුම් පෙත්සමක් මේ සමග **පැ-9** ලෙස ලකුණු කොට ඉදිරිපත් කර සිටිමි.

ඒ අනුව පැමිණිලිකරු ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ,

අ) විත්තිකරු ලබා ගන්නට යෙදුන ණය මුදල ලෙස **රු. 40,000** - ක මුදලක් විත්තිකරුගෙන් අයකර දෙන ලෙසත්,

ආ) විත්තිකරු ලබාගන්නට යෙදුන ණය මුදලට අදාලව සේවා ගාස්තු/කාලය දීර්ඝ කිරීමේ ගාස්තු ලෙස රු. **10,856** - ක මුදලක් විත්තිකරුගෙන් අයකර දෙන ලෙසත්,

ඇ) වර්ෂ 2023-12-06 දින සිට මෙම නඩුව පවරන තුරු ද නඩු පැවරීමේ දින සිට නඩු තීන්දු දින දක්වා ද ඉහත කී මුදල මත උපචය වූ නෛතික පොලිය විත්තිකරුගෙන් අයකර දෙන ලෙසත්,

ඇ) නඩු තීන්දු දින සිට තීන්දුගත මුදල ගෙවන තුරු එකී තීන්දු ගත මුදල මත උපචය වූ නෛතික පොලියද විත්තිකරුගෙන් අයකර දෙන ලෙසත්,

ඉ) නඩු ගාස්තු සහ

ඊ) ගරු අධිකරණයට හැගෙන වෙනත් සහ වැඩිමනත් සහනයන්ද ලබා දෙන ලෙස වේ.

පැමිණිලිකරුගේ නීතිඥ

පැමිණිල්ල සමග අමුණා ඇති ලේඛන

1. පැමිණිලිකාර සමාගමේ සංස්ථාපිත සහතිකය
2. විත්තිකරු විසින් ණය ලබාගැනීමට අදාලව ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමට අදාල දත්ථයන් ඇතුලත් අයදුම් පත්‍රය
3. විත්තිකරුගේ ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය සහ එකී ලේඛනය සමග වන විත්තිකරුගේ ඡායාරූපය
4. පැමිණිලිකරු සහ විත්තිකරු අතර ඇති කරගත් ණය ගිවිසුම
5. ගිණුම් වාර්තාව
6. සමත නොකිරීමේ සහතිකය
7. එන්තරවාසි ලිපිය හා අදාල තැපැල් භාණ්ඩ කුවිතාන්සිය
8. දිවුරුම් ප්‍රකාශය

පැමිණිලිකරුගේ නීතිඥ


**W. R. D. WEERASEKERA**
LLB (Hons) (Colombo)
Attorney-at-Law, Notary Public,
Company Secretary, Commissioner for Oaths,
No. 10/69, Sri Kalyani Gangarama,
Mattakkuliya, Colombo - 15.
Tel: 076 6402891 / 075 8980644